www.kidworship.kr

# මංගලයය සාදය

-The Wedding Feast-



29Page

**හ්රර්එසදබ** බොහෝ කාලයකට ඉහතදී, ගලීලයේ කානා නම් කුඩා නුවර විවාහ මංගල්‍ය උත්සවක් තිබුණා. යේසුස්වහන්සේ, උන්වහන්සේගේ මෑණියන් වගේම උන්වහන්සේගේ ගෝලයනුත් මේ මඟුල් ගෙදරට ඇවිත් සිටියා. පැමිණි සිටි සියලුම අමුත්තන් ඉතාම හොඳින් විනෝදවෙමින් ප්‍රීතියෙන් මංගල්‍යය සාදය භුක්ති වින්දා.

**මංගල්‍යයේ ප්‍රධානියා** මේ.. හැමෝම හොඳට කෑම භුක්ති විඳින්න. තව කෑම ගොඩක් තියෙනවා. බලන්න... මනමාලි, මනමාලයා ලස්සනයි නේද? හාහ්... හා...

..............................................................................................



30Page

**පොතේ ගුරා** පැමිණි සිටි සියලුම දෙනා හොඳ කාලයක් ගත කරමින් සිටියා. ඒ අතරේ හරි ඉක්මණින් සේවකයෙක් මංගල්‍යයේ ප්‍රධානියා ළඟට දුවගෙන ගියා. දුවගොස් මෙසේ කීවා.

**පළමු සේවකයා** හ්ම්.ම්හ්.. ආ.. අපිට හරි ප්‍රශ්ණයක්. වයින් ඉවරවෙලා... අපි හිතුවට වඩා අමුත්තන් මංගල්‍යයට ඇවිත් තියෙනවා. මොකද කරන්නේ දැන්... වයින් බිංදුවක්වත් නෑනේ...

**මංගල්‍යය ප්‍රධානියා** මොනවා? ! වයින් ඉවරයි ?? ඔහ් හිතවත, අපි දැන් මොනවද කරන්නේ ! වයින් නැතිව මේ සාදය පවත්වන්නේ කොහොමද! මේ භයානක තත්වයක් ! ගොඩක් දුර ඉඳන් ආව මේ අමුත්තන්ට අපි මොනවද දැන් දෙන්නේ ??

**පොතේ ගුරා** මංගල්‍යය ප්‍රධානියා හොඳටම කලබල වුණා. ඔහු කලබලෙන් එයට විසඳුමක් සොයමින් සිටියදී, යේසුස්වහන්සේගේ මෑණියන් වූ මරියාතුමී, වයින් ඉවරවීම පිළිබඳව දැනගත්තා. ඒ නිසා ඇය යේසුස්වහන්සේ ව සොයන්නට ගියා.

..............................................................................................



31Page

**මරියා** යේසුස්... මට ඇහුණා මංගල්‍යයේ දුන්න වයින් එක ඉවරයි කියලා. ඇවිත් උදව් කරන්න, ඔයාට පුලුවන්ද ?

**පොතේ ගුරා** යේසුස්වහන්සේ තමන්ගේ මෑණියන්ට මෙහෙම උත්තරයක් දුන්නා:

**යේසුස්වහන්සේ** අම්මා, මගේ වෙලාව තාම පැමිණියේ නෑ...

**පොතේ ගුරා** මරියාතුමියට යේසුස්වහන්සේ කිවූ සෑමදෙයක්ම තේරුණේ නෑ. ඒත් මේ වෙලාවේ යේසුස්වහන්සේ උදව් කරයි කියා ඇය විශ්වාස කළා. ඒ නිසා ඇය, යේසුස්වහන්සේ කියන ආකාරයට සෑම දේම කරන්නැයි කියා, මං-ගල්‍යයේ දාසයන්ට කීවා.

..............................................................................................



32Page

**පොතේ ගුරා** යේසුස්වහන්සේ සහ සේවකයන් මංගල්‍යය සාදය පවත්වමින් සිටි ස්ථානය-ටම ළඟා වුණා. එතැන ගල් භාජන 6ක් තිබුණා. සාමාන්‍යයෙන් මේ ගල් භාජනවල වතුර පුරවා තබමින් ඒවා භාවිතා කරන්නේ, භාජන වැනි දේ සෝදන්න සහ දුරගමනක් ගොස් ආවිට අත්පා සෝදා ගැනීමටයි...

යේසුස්වහන්සේ, සේවකයන්ට කතා කරමින් මෙසේ කීවා...

**යේසුස්වහන්සේ** මේ ගල් භාජනවලට වතුර පුරවන්න...

**පොතේ ගුරා** සේවකයන්ට ඒක තේරුණේ නෑ. ඒත් ඔවුන් යේසුස්වහන්සේ කී ආකාරයටම ගල් භාජනවල වතුර පිරවීම කළා.

**යේසුස්වහන්සේ** දැන් වතුර ටිකක් අරන් ගිහින් මංගලයයේ ප්‍රධානියාට පිළිගන්වන්න...

.........................................................................................................



33Page

**මංගලයය ප්‍රධානියා** මේක හරිම නරක දෙයක්... අනේ ! මම මොනවද දැන් කරන්නේ ? මේ තරම් අමුත්තන් ප්‍රමාණයකට වයින් මම කොහෙන් හොයන්නද ?

**සේවකයෙක්** උතුමාණෙනි, (මංගලයයේ ප්‍රධානියාට) මේ.. මේ වයින් ටිකක් බීලා බලන්න !

.........................................................................................................



34Page

**පොතේ ගුරා** සේවකයා විසින් ගෙනැවිත් දුන් වයින් එකේ රස බැලූ ගමන්ම මංගලයයේ ප්‍රධානියාගේ මුහුණ ප්‍රීතියෙන් පිරිගියා. මේ වයින් කොහෙන්දැයි කියා, ඔහු දැනගෙන සිටියේ නෑ.. ඒත් ඔහු උද්වේගයෙන්, පුදුමයෙන් මනමාලයා ළඟට දුවගෙන ගියා.

**මංගලයය ප්‍රධානියා** අනිත් අය නම්, හොඳම වයින් එක පළමුවෙන් දී බාල වයින් එක දෙන්නේ අමුත්තන් ටිකක් බීලා වැඩිවුණාම අන්තිමටයි. හාහ්... නමුත් දැන්, හොඳම වයින් එක! නියමයි..! හහ් හහ් හා...

**පොතේ ගුරා** යේසුස්වහන්සේ විසින් හාස්කමකින් වතුරවලින් සෑදූ වයින් එක රස විඳලා, එදා මංගලයය සාදයට පැමිණි සියලුම අමුත්තන් හොඳ කාලයක් ගත කළා.

**ජීවිතයට අදාල කිරීම** දුවේ පුතේ, ඔයාටත් ගොඩක් අවශ්‍යතාවයන් ඇති නේද? අපි ඒ ඔක්කොම කොළයක ලියමුද දැන්... ආහ්.. හරි... දැන් යේසුස්වහන්සේ ඔයාට මෙහෙම කියයි. "මගේ දුව,පුතා, මේ හැමදේම මම ඔයාට සුදුසුම වෙලාවේදී අනිව-ාර්යයෙන්ම දෙනවා"